
# MEDIA TODAY

මාධ්‍ය ලෝකය ඔබ අතට

Volume 01 /5th Issue / 2014
ISSN 2279-3402

www.mediatoday.lk



## COVER STORY

සිංහල සාහිත කෙතේ මහරු අස්වැන්න

# මාර්ටින් වික්‍රමසිංහ

## EXPLORE

ලෝක පුවත්පත් නිදහස් දිනය හා
ලෝක පුවත්පත් කලාවේදීන්ගේ දිනය

## O/L සහ A/L

සන්නිවේදනය හා මාධ්‍ය
අධ්‍යයනය පාඩම් මාලාව

## FEATURES

ලාංකේය වාර්තා සිනමාවේ තිඹිරිගෙය වූ
රජයේ චිත්‍රපට අංශය

කෙටි චිත්‍රපට

මාධ්‍ය අධ්‍යාපනය

## INNOVATION

Hydrascope

Rs. 200/=

නවයුගයෙන් අජටාකාශ යුගයකට MEDIA TODAY බුද්ධියට ආමන්ත්‍රණයක්

MEDIA TODAY
මාධ්‍ය ලෝකය ඔබ අතට
Volume 01 / 5th Issue / 2014
ISSN 2279-3402

**ජ්‍යෙෂ්ඨ සංස්කරණ උපදේශකත්වය**
කලාකීර්ති ආචාර්ය එඩ්වින් ආරියදාස

**සංස්කරණ උපදේශකත්ව මණ්ඩලය**
මහාචාර්ය විමල් දිසානායක
හවායි විශ්වවිද්‍යාලය,
ඇමරිකා එක්සත් ජනපදය

මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ
කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය රෝහණ ලක්ෂමන් පියදාස
කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය පැට්‍රික් රත්නායක
කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය අජන්තා හපුආරච්චි
කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ආචාර්ය ටියුඩර් වීරසිංහ
ශ්‍රීපාලි මණ්ඩපය,
කොළඹ විශ්වවිද්‍යාලය

**සංස්කරණය**
දිනේෂර පුංචිහේවා

**සඟරා සැලසුම්කරණය**
මහාචාර්ය පැට්‍රික් රත්නායක

**කවර නිර්මාණය**
මිනොරු රත්නායක

**නිශ්චල ඡායාරූපකරණය**
සමීර හෙට්ටිආරච්චි

**පරිගණක මෙහෙයවීම, පිටු සැකසුම හා මාධ්‍ය රූප**
අයි. එම්. අමාන්
මිනොරු රත්නායක

**ශෝධ්‍යපත්‍ර පරීක්ෂාව**
කුසුමචන්ද්‍ර අරංගල

**විවිධ සහාය**
කෞෂල්‍ය සමින්ද
දේවිකා මධුෂාණී

**යතුරු ලේඛනය**
ශසිකා නිරෝෂණී ගණේගොඩගේ
නිමාෂා ප්‍රභාෂිණී

**ප්‍රධාන කළමනාකරු**
කුසුමචන්ද්‍ර අරංගල

# මාධ්‍ය, සමාජ මාධ්‍ය, සාමය සහ වගකීම

සමාජයක ශිෂ්ටත්වය තහවුරු කරනු ලබන්නේ වල්බූරු නිදහසක් නොවිය යුතු මාධ්‍ය නිදහස විසින් බව අද දවසේ පිළිගැනීම යි. සමාජය සමඟ අත්‍යන්තයෙන්ම බැඳී තිබෙන "මාධ්‍ය", මාධ්‍ය හිමිකාරීත්වය (Media Ownership), මාධ්‍ය වෘත්තීයභාවය (Media Professionalism), මාධ්‍ය බුද්ධිමත්භාවය (Media Intelligence) යන ප්‍රධාන ප්‍රවාහ තුන ඔස්සේ දෝලනය වේ. සමාජයක යහ පැවැත්මට මාධ්‍ය මගින් සිදු කරනු ලබන බලපෑම මේ මත තීරණය වේ. සංස්කෘතීන් හා සමාජයක හර පද්ධතීන් ආරක්ෂා කර ගනිමින් සමාජයේ ප්‍රගමනයට 'මාධ්‍ය' මෙහෙයවීම එනිසා සමස්ත ජනමාධ්‍යවේදීන්ගේ යුතුකමක් මෙන්ම වගකීමක් ද වන බව තරයේ සිහි තබා ගත යුතු කරුණකි. එහෙත් අද දවසේ පුවත්පත්, ගුවන්විදුලිය හා රූපවාහිනියට එහා යමින් සමාජ මාධ්‍ය (Social Media) හරහා ජනමාධ්‍යවේදයේ කාර්යභාරය බොහෝ දෙනෙකු විසින් සිදුකෙරෙමින් පවතී. මෙහිදී ආචාරධර්ම, නීතිරීති හා සමාජ වගකීම් පිළිබඳ අවබෝධයෙන් තොරව සමාජ මාධ්‍ය මඟින් පුවත් සම්ප්‍රේෂණය වනු දැකිය හැකි ප්‍රධානතම ලක්ෂණයකි. මෙහිදී පළපුරුදු ජනමාධ්‍යවේදීන් මෙන් නොව ඔවුන් තමන් වෙත ලැබෙන පුවත් ස්වයංවාරණයකින් තොරව සමාජයට සම්ප්‍රේෂණය කරනු දැකිය හැකි වේ. එහිදී යම් අන්තරායකාරී බවක් සමාජයට අත්වෙයි. ඇත්ත ඇති සැටියෙන් වාර්තා කළ යුතු වුවත් එහි යම් තීරණාත්මක කරුණු කාරණා පිළිබඳව අවධානය යොමු කිරීම අනිවාර්යෙන්ම කළ යුතුය. එහෙයිනි ජනමාධ්‍යවේදීන් ජනමාධ්‍ය පිළිබඳ යම් හැදෑරීමකින් යුතුව ජනමාධ්‍ය තුළ හැසිරෙන්නේ. අරාබි වසන්තය ලෙසින් ඇරඹී අද දවස වන විට මැදපෙරදිග කලාපයේ ඉරාකය, ජෝර්දානය, සිරියාව, යේමනය ආදී බොහෝ රටවල් ISIS ත්‍රස්තයන්ගේ ග්‍රහණයට නතුවෙමින් තිබෙන මොහොතක ඔවුන්ගේ ත්‍රස්ත ක්‍රියා සඳහා වක්‍රාකාරව සමාජ මාධ්‍ය ද යම් බලපෑමක් සිදු කරයි. එහිදී ISIS ත්‍රස්තයන් තමන්ගේ සියලුම ත්‍රස්ත ක්‍රියා, ඝාතන පිළිබඳ වීඩියෝ පට, හඬ පට ආදිය මුදාහරිනු ලබන්නේ සමාජ මාධ්‍ය වෙත ය. එමඟින් ඔවුහු අන්තවාදය වෙත සමාජ මාධ්‍ය පරිහරණය කරන්නන්ට ආරාධනා කරති. මෙය අද ලෝකය හමුවේ ඇති බරපතළ තත්වයකි. සංඛ්‍යාලේඛන වලට අනුව 2013 වර්ෂයේ පමණක් ලෝකයේ ත්‍රස්ත ක්‍රියා 9707 ක් වාර්තා වී තිබේ. ඉන් 2495 ඉරාකය තුළ ද, 1144ක් ඇෆ්ගනිස්ථානය තුළ ද, 1920ක් පකිස්ථානය තුළ ද, 212ක් සිරියාව තුලද 300ක් නයිජීරියාව තුළ ද, 295 යේමනය තුළ ද, 622ක් ඉන්දියාවේ ද, 322 තායිලන්තයේ ද සිදුව තිබේ. මේ හැම ත්‍රස්ත ක්‍රියාවකටම සමාජ මාධ්‍ය හරහා යම් වීරත්වයක්, යම් ආකල්පයක් හා යම් සාධාරණීකරණයක් ආරෝපණය කිරීමට සමාජ මාධ්‍ය පරිහරණය කරන්නන් උත්සුක වී තිබෙනු දැක ගත හැකි වේ. අප රටේ ද වසර 30 ක ත්‍රස්තවාදය තුරන් කර දැන් නිදහසේ හුස්ම විඳින මොහොතකි. එහෙයින් යම් කුමන හෝ අරගලයක් මේ බිම තුළ ඇති නොවීමට සහජීවනය හා සංහිඳියාව ශ්‍රී ලාංකේය ජනතාව අතර වර්ධනය කළ යුතුය. ඒ සඳහා පමණක් සමාජ මාධ්‍ය වගකීමෙන් යුතුව මෙරට භාවිත කළ යුතු යැයි සමාජ මාධ්‍ය භාවිතා කරන්නන් අවධාරණයෙන් මතක තබා ගත යුතු කරුණකි. අපට පමණක් නොව මතු පරපුරටත් අද පවතින සාමය සහ සහජීවනය අයිති විය යුතුය.

දිනේෂර පුංචිහේවා

Printing, Publication & Distribution
Creative Media Corporation
P.O. BOX : 114 Baththaramulla,
Tele : 0112 785878 / 0115 730555
Fax : 0115 730588
Email : creativemediacmc@gmail.com
Web : www.mediatoday.lk




**45** කැමරාකරණය සඳහා ප්‍රවේශයක්
ගිතේන්ද්‍ර අමරතුංග

**47** ව්‍යවහාරය කියන්නේ අරමුණු
පරාක්‍රම ඒකනායක

**50** සිංහල ජනබුද්ධියේ සනාතන මූර්තිය මාර්ටින් වික්‍රමසිංහ
කවරයේ කථාව

අභිසාරී මාධ්‍යකරණය **65**
ආචාර්ය ටියුඩර් වීරසිංහ

O/L සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය **68**
නාමලී රසිකා මාකලන්දාව

සරලව දැනගනිමු Marketing **70**
සිසිල් එල්. බී. රත්නායක

ෆ්‍රෑන්ක් ගාඩ්නර් **73**
චංචලා බුලත්වත්ත

නිර්මාණ පරාසය පුළුල් කිරීමට අංග රචනය කලා තාක්ෂණය ප්‍රධාන සාධකයක් **74**
ජයන්තා රණවක

Portrait ප්‍රදර්ශනය **76**
බර්ටි ගුණසේකර

පශ්චාත් යුධ වාතාවරණයක සාමය ගොඩනැගීමේ අවශ්‍යතාව **77**
ඕෂධි හේරත්

ඇසිදිසි මතරම් **79**
දිනේෂර පුංචිහේවා

මාධ්‍ය අධ්‍යාපනය **80**
මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ

රූපවාහිනී තාක්ෂණය **82**
නාමල් සිල්වා

ලාභය මත තීරණය වන ෂානරය **85**
කථිකාචාර්ය සජිතා හේවාපතිරණ

සංස්කරණය උගනිමු **89**
හිරන්ත දිසානායක

සංරක්ෂණ සංකල්පය **90**
මහාචාර්ය සරත් කොටගම

මානව සන්නිවේදනයේ පියසටහන් **92**
නිශාන්ත පීරිස්

A/L සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය **94**
උදම් සතරසිංහ

සෙයිතොන් හෙවත් සුපිළිවෙළ **96**
ප්‍රසන්න අධිකාරී

මෙහි පළවන ලිපිවල අන්තර්ගතය එම ලිපි සම්පාදනය කරන ලේඛකයන්ගේ ස්වාධීන මතයයි. ප්‍රකාශන ආයතනයේ ප්‍රතිපත්තියක්, දර්ශනයක් හෝ මතයක් ඉන් පිළිබිඹු නොවේ.

# ලිපි සරණිය

MEDIA TODAY 5th Issue 2014



08 සාහිත්‍යයට කිරුළ පැලඳෙන සමය
කලාකීර්ති ආචාර්ය එඩ්වින් ආරියදාස

11 ලෝක පුවත්පත් නිදහස් දිනය
දිනේෂර පුංචිහේවා

12 ලෝක පුවත්පත් ඉතිහාසය
කුසුමචන්ද්‍ර අරංගල

13 ජනමාධ්‍ය නිදහස් දිනය නැවත සිතා බැලීමක්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ

15 ජනමාධ්‍ය නිදහසේ මිථ්‍යාව
ආචාර්ය සේන නානායක්කාර

17 සමාජයේ සංහතික ස්වරූපය පුවත්පත් නිදහස සහ සමාජ ප්‍රගමනය
ආචාර්ය ධර්ම කීර්ති ශ්‍රී රන්ජන්

19 සත්‍යය වැළලීම හා මිථ්‍යාව ගොඩගැනීම
මහාචාර්ය පැට්‍රික් රත්නායක

20 ශ්‍රී ලංකා පුවත්පත් ඉතිහාසය
ප්‍රදීපා සංජීවනී දිසානායක

22 ප්‍රඥා විස්මය 2014
Tokyo Cement

24 මාධ්‍ය නිදහස ආචාරධර්ම හා වගකීම
දයා ශ්‍රී නරේන්ද්‍ර රාජපක්ෂ

26 **MEIDA TODAY** මාධ්‍ය හදාරන පාසල් සිසුන් වෙත
ජාතික තරුණ සේවා සභාව

27 පස්වැදෑරුම් සන්නිවේදන සිද්ධාන්ත
මහාචාර්ය අජන්තා හපුආරච්චි

29 ප්‍රගතිය කරා ශික්ෂණය
ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර

31 රූපයට අපූර්වත්වය ගෙනෙන Hydrascope
ජයන්ත කරුණාරත්න

32 නර්තනයේ සන්නිවේදනාත්මක භාවිතය
එන්. ජී. ශෂී නිරෝශනී

34 සන්නිවේදන කතිකාවත
චන්ද්‍රපාල ලියනගේ - ජාතික රූපවාහිනිය


ලාංකේය වාර්තා සිනමාවේ තිඹිරිගෙය වූ රජයේ චිත්‍රපට අංශය 36
ශාස්ත්‍රපති හර්ෂ බී. අබේකෝන්

මාධ්‍ය භාවිතය සහ මෙරට ළමා පරපුර 38
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුමුදු කරුණාරත්න

ශ්‍රී ලංකේය මානව වංශලේඛ චිත්‍රපටය "ලංකා ගීතය" 41
සුමින්ද කිත්සිරි ගුණරත්න

දැන්වීම්කරණයේ නිර්මාණශීලී භාවිතය 43
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ

**MEDIA TODAY** කාලීන වැඩසටහනකට මුල පුරයි



# මාධ්‍ය සංකථන

## විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මූලික කොටගෙන ක්‍රියාත්මක දීපව්‍යාප්ත වැඩමුළු මාලාව

සමාජ ප්‍රගමනයේ හෝ අපගමනයේ තීරණාත්මක සාධකය බවට ජනමාධ්‍යය පත්ව ඇති අවදියක MEDIA TODAY සඟරාව කාලීන වැඩසටහනකට මුලපුරයි. යහ සමාජයක් උදෙසා පුරෝගාමී මාධ්‍ය කතිකාවක් ඇති කිරීම එහි කාර්යභාරය යි. ඒ අනුව මාධ්‍ය සංකථන නමින් දීපව්‍යාප්ත වැඩමුළු මාලාවක් සංවිධාන කෙරේ. හරවත් හා යහපත් සමාජයක් බිහිකර ගැනීමටත්, ඵලදායී අයුරින් මාධ්‍ය භාවිත කෙරෙන ආකාරය පිළිබඳව මාධ්‍යයට ලැදි ජනතාව, සිසුන් හා මාධ්‍යවේදීන් අතර ප්‍රමාණාත්මක හා ගුණාත්මක කතිකාවකට මංපෑදීමත් මෙම මාධ්‍ය සංකථන වැඩපිළිවෙළේ අරමුණ යි. ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක අවශ්‍යතාව, නූතන ජනමාධ්‍ය ප්‍රවණතා, අද්‍යතන මාධ්‍යවේදියා හා මාධ්‍යවේදීන්ට ඇති අභියෝග, සංවර්ධනය හා මාධ්‍ය, යහපැවැත්ම වෙනුවෙන් මාධ්‍ය භාවිතය ආදී මාතෘකා මෙම කතිකාවතට පාදක වෙයි. ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික රූපවාහිනිය හා ජාතික තරුණ සේවා සභාව මෙහි සෙසු සහභාගිත්ව ආයතන යි. මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයෝ සම්පත්දායකයන් හා දේශකයන් ලෙස ඊට එක් වෙති.

දිස්ත්‍රික් මට්ටමෙන් සැලසුම් කරඇති මෙම දීපව්‍යාප්ත මාධ්‍ය සංකථන වැඩමුළු මාලාවේ පළමුවැන්න සමස්ත මොණරාගල දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි මොණරාගල පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට විධි-විධාන යොදා තිබේ. දිස්ත්‍රික්කය තුළ මාධ්‍ය හා සන්නිවේදන අධ්‍යයනය විෂය උගන්වන ගුරුවරු, එම විෂය හදාරන පාසල් සිසුහු, විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, කාර්මික විද්‍යාල හා වෙනත් අධ්‍යාපන ආයතන වල මාධ්‍ය විෂය ඉගෙන ගන්නා සිසුහු ප්‍රාදේශීය මාධ්‍යවේදීහු මෙන්ම මාධ්‍යයට හිතැති ජනතාව ද ඊට සහභාගී කර ගැනෙති.

ඉදිරි තුන් වසර තුළ මාධ්‍ය සංකථන වැඩමුළු 25ක් පැවැත්වීමට සැලසුම් කර තිබේ.

**සහභාගිත්ව ආයතන**

ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය හා අමාත්‍යාංශය

අධ්‍යාපන අමාත්‍යාංශය

SRI LANKA Youth

ජාතික රූපවාහිනිය

**මාධ්‍ය සංකථන වැඩමුළු මාලාව සඳහා අනුග්‍රාහක දායකත්වය**

metropolitan | Coca-Cola | HUTCH | David Pieris Group of Companies | PEOPLE'S BANK THE PULSE OF THE PEOPLE | Anchor

# සමාජයේ සංහතික ස්වරූපය පුවත්පත් නිදහස සහ සමාජ ප්‍රගමනය

ආචාර්ය ධර්ම කීර්ති ශ්‍රී රංජන්

පුවත්පත් නිදහස, සමාජ ප්‍රගමනය සහ සංවර්ධනය යනු එකිනෙකින් වියුක්ත කළ නොහැකි අනෙකුත් මානව සහ සමාජ කාරණාවන් සමඟ ප්‍රබල ලෙස සංයුක්ත වන සංකල්පයන් බව පැහැදිලි ය. මෙම සංකල්ප සහ එහි ක්‍රියා ස්වරූපයන්ට තනි තනිව පැවතිය නොහැකිවාක් මෙන්ම ඒවායෙහි සමාජ අර්ථය ගොඩ නැගෙන්නේ ද සමාජ පද්ධතික (Social System) ක්‍රමවේදය මූලික වීමෙනි. පුවත්පත යන සංකල්පය අර්ථ ගැන්වෙන්නේ සමාජ ක්‍රමවේදයෙහි නිෂ්පාදිතයක් ලෙස යි. මෙයට සමාජ ප්‍රගමනය සහ සමාජ සංවර්ධන අරමුණු කරා මිනිසා පෙළඹවිය හැකි වුවත් එම කෘත්‍යාත්මක ප්‍රවේශයෙන් අවදිශානතීනට සමාජය පද්ධතිකව මෙහෙයවීමේ ස්වරූපය පිළිබඳ ගැටලුවට අප සමාජය මුහුණ දී තිබේ. මෙලෙස වර්තමාන පුවත්පතෙහි හැසිරීම පිළිබඳ සමාජ කාරණාව අද්‍යතනයෙහි සංවේදී බවක් ගොඩනගා ගන්නේ එය සමාජ යන්ත්‍රණයේ ම කොටසක් ලෙසට ප්‍රබලව සංයුක්ත වී ඇති බැවිනි.

පුවත්පත සහ නිදහස යනු අලුත් සංකල්පයක් නොවේ. මේ පිළිබඳව ඉතිහාසයේ සිටම ලෝක සමාජය තුළ සංකල්පීයවත්, න්‍යායාත්මක සහ දර්ශනාත්මකවත් සංසිද්ධිකව විශ්ලේෂණයට භාජනය වන්නේ එය එතරම් ම මානව සජීවීකරණය හා සක්‍රීය ලෙස බද්ධ වන්නක් බැවිනි. පුවත්පත සහ ඒ පිළිබඳ නිදහසත්, පුවත්පත නිසා ඇති විය යුතු සමාජ නිදහසත් ගැන බොහෝ දුරට ම ශිෂ්ටාචාරික චින්තනය සහ විඥානයත්, ඒ තුළින් ගොඩ නැගිය හැකි සමාජ ව්‍යුහාත්මක වෙනස්කම් සහ එහි සක්‍යතා ගැනත්, අවබෝධය ගොඩනගා ගත හැක්කේ නිදහස යනු කුමක්ද යන්න පිළිබඳව ගොඩනැගෙන අවබෝධය සහ ප්‍රත්‍යක්ෂකරණය තුළිනි. අප සමාජයේ පුවත්පත සහ අදාළ නිදහස පිළිබඳ ඉල්ලා සිටීමේ තර්කය ගොඩනැගෙන්නේ ඍජු සංවිධානමය සහ මතවාදී කාරණාවක් ලෙස බැව් පැහැදිලි ය. නමුත් ඒ පිළිබඳව විද්‍යාත්මක සහ සමාජ පර්යේෂණාත්මක අවබෝධයක් ඇත් ද යන්න පිළිබඳ ගැටලුව ඉතිහාසයේ සිටම පවතී. සමාජය සහ එහි ව්‍යුහාත්මක කාරණාවන්, එහි දිශානතීන්, මානව මනස, ශික්ෂණ ක්‍රියාවලීන් සහ සමාජ ප්‍රමිතීන් පිළිබඳව අවබෝධ නොවන්නවුනට නිදහස පිළිබඳ ගැටලුව අනවරත ක්‍රියාවලියකි. මේ අනුව මේ පිළිබඳ තර්කය මෙහි දී ගොඩ නගන්නට උත්සාහ ගන්නේ නිදහස යන සංකල්පයට පෙරටුව ආචාර ධර්ම යන සංකල්පය කේන්ද්‍රකරගත යුතු බැව් පැහැදිලි කිරීමෙනි.

නිදහස සහ ආචාර ධර්ම අතර ගොඩනැගෙන්නේ අවියෝජනීය සබඳතාවකි. ආචාර ධර්ම බිඳ වැටෙන සමාජයක නිදහස පිළිබඳ ගැටලුව මනෝරාජික නොවනු ඇත. මානව සමාජයෙහි ප්‍රගමනය, පැවැත්ම සහ සංවර්ධනයෙහි මහා පොදු ලක්ෂණය ලෙස ආචාර ධර්ම සැලකිය හැකි ය. කුල, ගෝත්‍ර, භූගෝලීය සීමා තුළ ගොඩනැගෙන ආචාර ධර්ම පිළිබඳ සංකල්පයට වඩා ගෝලීය ආචාර ධර්ම පිළිබඳ කතිකාවට මාධ්‍ය විවර විය යුතු ය. මින් අදහස් වන්නේ විශ්වීය සමාජ ක්‍රමවේදයට අවශ්‍ය ආචාර ධර්ම නොමැති බව නොවේ. එහෙත් එහි ක්‍රියාත්මකතාව පිළිබඳ ගැටලුව සමාජයෙහි පවතී. බොහෝ දෙනෙකු සලකන්නේ ආචාර ධර්ම සමාජ සංවර්ධනය සඳහා සංරෝධකයක් බවයි. එහෙත් එය එසේ නොවන්නේ ආචාර ධර්ම තුළ ප්‍රබල කෘත්‍යාත්මක මෙහෙයක් තිබෙන බැවිනි.

සංවර්ධනය පිළිබඳ බොහෝ අදහස් තුළ ගැබ් වන්නේ එය භෞතික සාධකයන්ගේ නිරපේක්ෂ ක්‍රමවේදයක් ලෙසයි. එහෙත් සංවර්ධනය පිළිබඳ මහා පොදු සාධකය ගොඩනැගෙන්නේ ආධ්‍යාත්මික ක්‍රියාවලිය මූලික වීමෙන් පමණක් නොව එය සක්‍රීය ලෙස සමාජ සංස්ථා සහ දින චර්යා යාන්ත්‍රීකරණයේ කොටසක් බවට ද පරිවර්තනය වීමෙන් ය. ඒ අනුව බුද්ධිමය සහ ආධ්‍යාත්මික ලෙස සංවර්ධනය වන සමාජයක නිදහස යන සංකල්පය ගැටලුවක් බවට පත් නොවනු ඇත.

මාධ්‍ය මගින් සිදු විය යුතු වඩාත් ප්‍රබල සහ සක්‍රීය ක්‍රියාවලිය වන්නේ සමාජ ප්‍රගමනය යි. සමාජ ප්‍රගමන කාර්යය සඳහා අනුගත කිරීමේ විවිධ ක්‍රමවේදයන් සංහතික මාධ්‍ය තුළ අර්ථ ගැන්විය හැකි වුවත්, එහි ගොඩනැගෙන විවිධ හැඩතල සහ නිර්මාණයන් උගතුන්ගේ සහ බුද්ධිමතුන්ගේ ප්‍රශ්න කිරීම් වලට නතුව තිබේ. වර්තමාන මාධ්‍ය පිළිබඳ සමාජ විද්‍යාත්මක දෘෂ්ටිය තුළ පැහැදිලි වන්නේ ද මාධ්‍ය නිසා මානව නිදහස අභිබවා වී, සමාජය ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිව්‍යුහගත කිරීම් වලට අපහසු වන අයුරින් ම සෝදා පාලුවකට පත් වන අභියෝගයට මුහුණ දී ඇති බව යි. ඒ අනුව මෙහි කේන්ද්‍රීය ගැටලුව මාධ්‍ය / සමාජ ආචාර ධර්ම, මාධ්‍ය සමාජ පර්යේෂණ, සමාජ විද්‍යාත්මක චින්තනය සහ දැනුම පිළිබඳ ගැටලුව බැව් පැහැදිලි ය. නිදහස පිළිබඳ සංකල්පය දිගු කාලීනව විවරණය වුවත් ඒ පිළිබඳ ගැටලුව අත්‍යවශ්‍යක ප්‍රකාශනයක් ලෙස තව ද ගොඩනැගෙන්නේ විවිධ ක්‍රමවේද තුළින් නිදහස එතරම් ම දූෂණය වී ඇති බැවිනි. මේ අනුව මාධ්‍ය ආචාර ධර්ම බිඳ වැටෙන සමාජයක සමාජ ආචාර ධර්ම පිළිබඳ ගැටලුවත්, සමාජ ආචාර ධර්ම බිඳ

වැටෙන සමාජයක මාධ්‍ය ආචාර ධර්ම පිළිබඳ ගැටලුවත් අන්තර් පරායත්තතා (Reciprocity) නිර්මාණයක් ලෙස ගොඩනැගෙන අතර එහි ගැටලු සහ අභියෝගයන්ට වර්තමාන සමාජයට මුහුණ දීමට සිදුව තිබේ.

සමාජයේ මූලිකම ලක්ෂණය වන්නේ සංහතික බව යි. සමාජ ව්‍යුහය තුළ අත්‍යාවශ්‍යක සංහතිකයේ කාරණාවන් වන පවුල, ආර්ථික සාධක, අධ්‍යාපනික සාධක, නෛතික ස්වරූප, ආගම සහ සමාජ සංස්කෘතික ක්‍රියා ආදිය පුවත්පත සහ මාධ්‍ය නිදහස යන සාධකයන්හි දී අමතක කළ හැකි නොවේ. ඒ අනුව නිදහස සහ ආචාර ධර්ම යනු මෙම සංහතිකය සම්බන්ධිතව ගොඩනැගිය යුතු අත්‍යාවශ්‍යක සමාජ ක්‍රියාවලියක් බවට තර්කය ගොඩනැගේ. මෙහි සංකීර්ණත්වය නිසාම මේ පිළිබඳ ප්‍රබුද්ධ සංවාද, සමාජ පෙළ ගැසීම් ආදිය පිළිබඳව බොහෝ දෙනාගේ අවධානයට යොමුව තිබේ. ආචාර ධර්ම මඟින් පුද්ගලයා සහ සමාජය තුළ ස්වයං පැවතුම් ශක්තියක් නිර්මාණය කරන අතර, එය සමාජයෙහි පැවැත්මේ ප්‍රබලතම කොන්දේසිය බවට මෙන්ම සමාජ යන්ත්‍රණයේ ස්වයංක්‍රියත්වයේ ස්වරූපයට ද බලපෑම් කරයි.

පුවත්පත් නිදහස යනු ප්‍රකාශනයේ නිදහසයි. ප්‍රකාශනයට නිදහස ඇති සමාජය සහ ප්‍රකාශනයට නිදහස සීමිත සමාජය යනු පුරවැසි අසමමිතික සබඳතා ගොඩ නංවන, සමාජ විභේද ආශ්‍රිත ව්‍යුහයන් සහ සමාජ පරිවර්තන ගුණයෙන් යුතු සමාජ ප්‍රවර්ගයන් බැව් පෙනේ. මෙම එක් එක් ප්‍රවර්ග තුළ දයලෙක්තික (Dialectic) සමාජ සබඳතාවක් ද ගොඩනැංවේ. යම් රටක හෝ සමාජයක ප්‍රකාශන නිදහස යනු ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදය (Strong Democracy) පිළිබඳ කියවීමක් බවට UNESCO ප්‍රකාශනයෙන් ද පැහැදිලි කරයි. ප්‍රජා සහභාගිත්වය (Community Participation) සහ මානව සංවර්ධනය (Human Development) සඳහා ප්‍රබල කාරණාවක් බවට එය පත් වේ. ආචාර ධර්ම පදනම් වූ නිදහස් ප්‍රකාශනයන්ට හිමිකම් ඇති සමාජය අනුකලනාත්මක (Integration) හෙවත් සමෝධාන ගුණයෙන් ශක්තිමත් ය.

ඒ තුළ තිරස් සහ සිරස් සන්නිවේදන සහ සම්භාෂණ අවකාශ පුළුල් කර ගැනීමේ සක්‍යතාව පවතී. සමාජ අනුකලනය නැමැති සංකල්පයට නිදහස යන්න ගොඩනැගිය නොහැකි නමුත් ආචාර ධර්මයන්හි සක්‍යතාවය තුළ සමාජ සහයෝගීතාවයට (Social Solidarity) අවශ්‍ය සාධනීය පදනම ගොඩනැගිය හැකි වේ. ඒ අනුව ප්‍රකාශන නිදහස සහ සමාජ / මාධ්‍ය ආචාර ධර්ම අතර ශක්තිමත් වන ආපෝහක සබඳතාවය පිළිබඳව ද අප විසින් හැදෑරිය යුතු ය. මින් පැහැදිලි වන්නේ පුවත්පත් නිදහස සහ සංහතික මාධ්‍ය නිදහස යන සංසිද්ධික සමාජ කාරණාව තුළින් සමාජය පිළිබඳ කාය ව්‍යවච්ඡේදාත්මක චිත්‍රයක් ද නිර්මාණය කර ගත හැකි බවයි. අනෙක් අතට සන්නිවේදනය හෙවත් ප්‍රකාශනය යනු මූලික මානව අවශ්‍යතාවක් (Basic Human Need) පමණක් නොව සමාජ ක්‍රියාවලියේ මූලිකාංගයක් මෙන්ම සමාජ සංවිධානයේ ක්‍රියාශීලී උත්ප්‍රේරකයක් බවට ද පත් වේ. එය තොරතුරු සමාජයක කේන්ද්‍රික ලක්ෂණයක් මෙන්ම සංස්කෘතික ස්වායත්ත ගතිකයේ මූලික කාරණාවක් බවට ද පත් වේ.

තාක්ෂණික සහ තොරතුරු ක්‍රියාවලියත් සමඟ සමාජ පරිණාමයේ ද වේගවත් බවක් ගොඩ නැංවේ. සමාජය සාම්ප්‍රදායික ස්වරූපයේ සිට තාක්ෂණික යුගයකට අවතීර්ණව ඇත. ඒ අනුව වැඩවසම් ආකෘති යටතේ ගොඩනැගුණු තොරතුරු වාර්තා කිරීම නැතහොත් තොරතුරු සෙවීම (Journey-Journeyman) වර්තමානය වන විට Online Journalism දක්වා වර්ධනය වෙමින් භූගෝලීය සීමාවන් ද අතික්‍රමණය කරමින් ගෝලීය සමාජය සමඟ අන්තර් ක්‍රියාවේ නිරත වීමේ ක්‍රමවේදය ගොඩනංවාගෙන තිබේ. මේ අනුව සාම්ප්‍රදායික සමාජයේ ගොඩ නැගුණු සාමූහික මනසෙහි (Collective Mind) ස්වරූපය සහ ක්‍රියාකාරිත්වය තාක්ෂණික ක්‍රමවේදය විසින් වෙනස් කොට තිබේ. මෙම තාක්ෂණික භාවිතාව තුළින් සිදු වන්නේ පුවත්පත් කලාවේදයේ මිය යාම නොව එහි ගතිකයන්ගේ ව්‍යුහාත්මක ලක්ෂණයන් හි පරිණාමය යි.

අංකිත හෙවත් ඩිජිටල් කරණය ඔස්සේ ග්‍රාහක පිරිසට (Audience) වඩා භාවිත පිරිස (Users) වර්ධනය වී තිබේ. Video, Audio සහ Text (පෙළ) සීමා රහිත ලෙස හුවමාරු වෙමින් පවතී. මෙම පෞද්ගලික මාධ්‍ය ක්‍රමවේදය ඔස්සේ මෙන්ම අන්තර්ජාල මාධ්‍ය භාවිතය ඔස්සේ ද තොරතුරු හුවමාරු කර ගැනීම් සිදු වන විට පුද්ගලාන්තර සහ සමාජ සන්නිවේදනය තාක්ෂණය විසින් මෙහෙයවීම සිදු කරනු ලබයි. ඒ අනුව සදාචාර භංගයක් මෙම ව්‍යුහය විසින් සිදු කිරීමක් ද දැකිය හැකි වන අතර ඔවුන්ගේ පුද්ගල භාවාත්මක ස්වරූපයන් සහ පරස්පර අභිලාශයන් ද මේ තුළින් හඳුනා ගත හැකි වේ.

මේ අනුව පුවත්පත් කලාවේදය සහ වාර්තාකරණය යනු සරල ක්‍රියාවලියකට වඩා ගවේෂණාත්මක, (Active and Reactive), පර්යේෂණාත්මක සහ විශ්ලේෂණාත්මක ක්‍රියාවලියක් බවට පත් වන අතර නිදහස සහ ආචාර ධර්ම පාදක වූ යන්ත්‍රණයකි. මෙම කාරණාව සමාජයේ සමස්ත සංහතිකයට ම බලපාන්නේ නමුත් මාධ්‍ය පරිශීලනයේ සමානත්වයකින් යුතු මානව සමාජ අවශ්‍යතා නොමැති නිසා පෞද්ගලික රුචි අරුචීන් බොහෝ දුරට ම නිදහස සහ ආචාර ධර්ම නැමැති පොදු සාධකය තුළ සිට තෘප්තිමත් කර ගැනීමේ හැකියාව සමාජයට පවතී.